## ගිනි නිවීම

කිසියම් හේතුවක් නිසා ඒ රටේ විශාලතම කම්හල ගිනිගත්තේය. ගින්න ඉතා ඉක්මනින් ඇවිලී පැතිරෙන්නට විය. අයිතිකරුවෝ වහා ගිනි නිවන ආයතනයකට ටෙලිපෝන් කළෝය. ඒ පැමිණි ගිනි නිවන හමුදාවේ හටයෝ ගින්න ඉතා අධික නිසා ඒ කිට්ටුවටවත් යාමට නොහැකිව තමන්ට එය නිවා දමන්නට අපහසු බව කියා ආපසු යන්නට ගියෝය.

කම්හල අයිතිකරුවෝ නගරයේ තවත් ගිනිනිවන කොම්පැනියකට වහා දැන්වූහ. විනාඩි කීපයකින් ඉතා අබලන් ගිනිරථයකින් වේගයෙන් පැමිණි ඒ හමුදාව රථය ඉතා නිර්භීත අන්දමින් නැවැත්වූයේ ගින්න ළඟමය. ගින්නට ගෑවී නොගෑවී වගේය. වහා ක්‍රියාත්මක වූ ඔව්හු ගින්න නිවා දැමූහ. ඒ කඩිනම් ක්‍රියාකාරී වීම නිසා කම්හලේ යන්ත්‍ර සූත්‍ර රාශයක් බේරාගැන්මට හැකිවීය. එයින් සතුටට පත් කම්හලේ අධ්‍යක්ෂකවරු ඒ ගිනි හටයින්ට පොරොන්දු ගාස්තුවට අමතරව තවත් ඩොලර් දහ දාහක් දුන්හ.

ඒ මුදල් දෙන අතරේ එක් අධ්‍යක්ෂකවරයෙක් ඒ ගිනි නිවන හමුදාවේ ලොක්කාගෙන් මෙසේ ඇසීය.

“ මේ දුන්න අමතර මුදලින් ඕගොල්ල කරන්න බලාපොරොත්තු වෙන්නෙ මොකක්ද කියලා අපි දැනගන්න කැමතියි ”

“ අපි මුලින්ම කරන්නේ ඒ අපි ආපු ගිනි වාහනේ බ්‍රේක් ටික හදාගන්න එක.”

ලිහිණියා LIHINIYA
ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල
වසර 20 ක අඛණ්ඩ මිත්‍රශීලී සේවය
කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන
ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ
එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප
පිට්ටු, රොටි කොත්තු, බුරියානි
උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.
Tel. 0208 450 9052
66 Cricklewood Broadway, London NW2 3EP

UK IMMIGRATION SERVICES
Points Based System - Tiers 1 2 4 & 5
Indefinite Leave to Remain,
Naturalisation, Marriage,
Elderly Dependents, Domestic workers,
Out of rules applications (overstays)
UK Immigration Appeals
Please call for appointment
Colvin L. De Silva
Accredited Immigration Advisor
Tel. 020 8906 3747 Mobile 07956 502019

වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි
සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ
♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 448270 / 432236
♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල
සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක් ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.
දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.
TRICO
Shipping & Forwarding Ltd
555 White Hart Lane
London N17 7RP
Telephone 0208 888 8787
Fax 0208 889 5445
E-Mail : trico@tricoshipping.com
නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය



## පාඩම

*පෙම්වතියගේ පියාගේ විරුද්ධතාව නොතකා ඇය හා විවාහ වූ සුමනදාස මසකට පසු ඇයද කැටුව ඇයගේ දෙමාපියන්ගේ නිවසට ගියේය.*

**සුමනදාස :** මාමණ්ඩි මට එදා කිව්වෙ දුව බලන්න මේ ගෙදරට ආවොත් හොඳ පාඩමක් උගන්නනවා කියලා නේ... ඔන්න අපි කසාද බැන්දා.... මෙන්න දැන් ගෙදරටත් ආවා.... බලමු මාම උගන්වන පාඩම මොකක්ද කියලා....

**මාමණ්ඩි :** දැන් ඔය උඹ කරගත්තු විනාසෙට වඩා තව මොන පාඩමක් උඹට මං උගන්වන්න ද බැනෝ ?

## අනතුර වුණ හැටි

“ කොහොමද මේ අනතුර වුණේ ? ”

“ මගේ දකුණු පැත්තෙන් පාපැදිකරු ඉස්සර කළා... ඉස්සරහින් බස් එක ආවා.... වම් පැත්තෙන් කාර් එකක් ඕවර්ටේක් කරන්න ආවා....”

“ හරි.... හරි... අයිසේ... වෙච්ච දේ කෙටියෙන් කියනවා...”.

“ එහෙනම් රාළහාමි මෙහෙම ලියාගන්න.... පාපැදිකරු මට ඉස්සර කළා....දඩෝං ගෑවා ....බුදු අම්මෝ ගෑවා....එතනම ඉවරයි.... ”

## අමාරුවෙන් ඉගෙනීම

ගුරුතුමිය පන්තියේ සිසුන්ට ලොව නමගිය පුද්ගලයින් ඉතා අමාරුවෙන් ශිල්ප ශාස්ත්‍ර හැදෑරූ අන්දම විස්තර කළාය.

**ගුරුතුමී :** මේ ළමයි දන්නවද ඒබ්‍රහම් ලින්කන් තමාගේ ඉගෙනීමේ කටයුතු සියල්ලම පාහේ කරලා තියෙන්නේ ගිනි උදුනේ ආලෝක යෙන්..... මොසාට් තම සංගීත නිර්මාණයන් සියල්ලම පාහේ කර ඇත්තේ ඉටි පන්දම් ආලෝකයෙන්..... ගැලිලියෝ අළුත් සොයා ගැනීම් සියල්ලම පාහේ කරලා තියෙන්නෙ භූමිතෙල් පහනක ආලෝකයෙන්......

*මෙවෙලේ පසුපස පේළියේ සිටි ඇම්ඩන් ප්‍රශ්නයක් ඇසීමට අත එසවීය.*

**ගුරුතුමී :** ඔව්! ඇම්ඩන්.... මොකක්ද ප්‍රශ්නෙ?

**ඇම්ඩන් :** මිස් මට දැනගන්න ඕන දවාලෙ අව්වර එළිය තියන වෙලාවට ඒ ගොල්ල මොනවද කළේ කියලා....?

## බාගෙට අන්ධවීම

“ මේ අන්ධයාට රුපියලකින් ආධාර කරන්න ”

යනුවෙන් ලියූ බෝඩ් එකක් ඉදිරියේ තබාගෙන හිඟාකන අන්ධයෙකි. ළඟට කිට්ටුවූ මිනිසෙක් මෙසේ කීවේ ය.

“ තමුසෙ අන්ධයි කියල කිව්වට එක ඇහැක් හොඳට පේනව නේද? ”

“ හා එහෙනම් සත පණහක් දෙන්න” අන්ධයා කීවේ ය.

## ගෑණුන්ගෙ වරද!

හිර ගෙදරට නියමව ගත කරන දෙවන දිනයේ එහි සිටි සුහද ජේලර් සමග බොහෝ වේලාවක් කතාවට වැටුණු හිරකාරයා මෙසේ කීවේය.

“ ගෑණු තමයි මහත්තෙයෝ මට මේ අවාසනාව ගෙනාවෙ....”

“ ගෑනු.....? මොන විදියෙ ගෑනුද....? ”

“ ඔය හැන්ඩ් බෑග් අරගෙන පාරෙ යන ගෑනු උදවිය තමයි.....”

***ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි අදහස් හා දැන්වීම් ඒවා පළකරන අයගේය. ඒ පිළිබඳව කර්තෘගේ කිසිදු වගකීමක් නැත.***

***ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් ඔබේ ගෙදරට ගෙන්වාගන්නට පවුම් 11 ක චෙක්පතක් Lanka Viththi යනුවෙන් ලියා පහත සඳහන් ලිපිනයට එවන්න.***

**Lanka Viththi**
**P. O. Box 64678,**
**London NW3 9LS**

Community Legal Service
ANTONS SOLICITORS
Community Legal Service
For Quality Services
We offer a comprehensive range of Legal Services.

Conveyancing
- Sale & Purchase
- Right to buy (Council House)
- Re-Mortgage
- Assignment of Lease
- New Lease
- Licensing Applications
- Contractual Disputes

Immigration
- Asylum cases
- Asylum Application
- Judicial Reviews
- Extensions of Visas
- Marriage Applications
- Work Permits
- Business Visas

*For a fee of £299 for Residential, £599 for Commercial excluding vat & disbursement*

*Contact -* Mrs Rani Bulathwela 07808158360
Vajira – 07887840227
ANTONS SOLICITORS
14 Wordsworth House, Wordsworth Parade
London N8 0SJ
Tel. 0208 888 6211 Fax 0208 888 1403




## A Day Care Centre for Husbands
## සැමියන් රැකබලාගන්නා මධ්‍යස්ථානය

**The advert further explains:**

**Husband Day Care Centre**
Need time to relax?
Need time to yourself ?
Want to go shopping?
Leave your husband with us!
We look after him for you !
You only pay for his drinks !

Some wives find their husbands are too much to handle and wish they are looked after by someone while they are away. This is that place!

දැන්වීමේ මෙසේ සඳහන්ව ඇත.
මේ සැමියන් රැකබලාගන්නා මධ්‍යස්ථානයයි !
ඔබට විවේකය අවශ්‍ය නම්, හිත නිස්කලංකව සාප්පු යාමට අවශ්‍ය නම්, ඔබේ සැමියා අප ළඟ තබා යන්න. අපි ඔහු හොඳින් බලාගන්නෙමු. ඔහුගේ බීම සඳහා පමණක් අපට මුදල් ගෙවන්න !
සමහර බිරියන්ට සිය සැමියන් ආං බාං කිරීම ලේසි නැත. මේ මධ්‍යස්ථානය එවැනි අය සඳහාය.

SHANTHI & CO ✻✻✻✻✻
Solicitors & Commissioners for Oaths
We are an established law firm in North London
Specialising in Immigration matters (Visas, Tier 1 General - Highly Skilled Migrants / Tier 2 Skilled Workers (WorkPermits), Students, Domestic Workers, Appeals - Judicial Reviews etc.)
- Residential / Commercial Conveyancing
- Landlord and Tenant Disputes ♦ Divorce ♦ Employment Law
- General Litigation (Sale of Goods, Services, Debts etc.)
- We offer comprehensive services on legal maters in Sri Lanka

*Contact*:- Shanthi Senadheera (*Solicitor*) Padmini Senadheera (*Solicitor*) Dinu Senadheera (*Solicitor*)
206 Seven Sisters Road, Finsbury Park, London N4 3NX
Tel. 020 7561 9494 Fax 020 7561 9495
Emergency: 07956 129 642 shanthi.co@btconnect.com